ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1983 අංක 7 දරන
# යාපනයේ දේව ජීවිත සමිතිය (සංස්ථාගත) කිරීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ජනවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ජනවාරි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිල : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1983 අංක 7 දරන යාපනයේ දේව ජීවිත සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1983 ජනවාරි මස 27 වන දින]

එල්.ඩී.—ඕ. 47/81.

**යාපනයේ දේව ජීවිත සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"යාපනයේ දේව ජීවිත සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමිතියක්, එකී සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති හා අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව, ඒ සමිතියට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් යාපනයේ පිහිටුවා තිබුණු හෙයින් ද :

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සමිතිය විසින් මේ දක්වා සාර්ථක ලෙස කරගෙන ගොස් හා ක්‍රියාත්මක කර ඇති හෙයින් සහ ඒ සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1983 අංක 7 දරන යාපනයේ දේව ජීවිත සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) යාපනයේ දේව ජීවිත සමිතියේ දැනට සාමාජිකයන් වූ තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් "යාපනයේ දේව ජීවිත සමිතිය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇත්තා වූ ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තව ද සංස්ථාව විසින් සංස්ථාවේ නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම ද සංස්ථාවට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ යුතු හා කළ හැකි වන්නේ ය. යාපනයේ දේව ජීවිත සමිතිය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) (i) පොත්, පත්‍රිකා, සඟරා සහ වෙනත් වාර සංග්‍රහ ප්‍රසිද්ධ කිරීමෙන් ;

(ii) ආගමික දේශන, සාකච්ඡා සභා, සම්මේලන සහ ඥානකාන්ති (ධර්ම විවේක) පැවැත්වීමෙන් ;

(iii) ආසන, ප්‍රාණයාම සහ වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ ක්‍රමවත් පුහුණුවක් සහිතව පූජා, වැඳුම් පිදුම්, භක්ති, ඥාන, කර්ම සහ හත්ථ යෝග මගින්

ජ 55429 — 11,600 (81/02)

අධ්‍යාත්මික පුනර්ජීවයක් ලබා ගැනීමට සහභාගි වන්නන් හට හැකිවනු පිණිස යෝගි ව්‍යායාම් සහ සදාචාරාත්මක වූත් අධ්‍යාත්මික වූත් සාධන පුරුදු පුහුණු කිරීමට මධ්‍යස්ථාන හෝ ශාඛා සමිති පිහිටු වීමෙන් ;

(iv) ඍෂිවරුන්ගේ, සාදුවරුන්ගේ, ආගම් වක්තෘ වරුන්ගේ සහ යෝගීන්ගේ සනාථන ධර්ම ඉගැන් වීම් පතුරුවා ලීමෙන් ;

(v) පුස්තකාල සහ කියවීම් ශාලා විවෘත කොට පවත්වා ගෙන යාමෙන් ;

(vi) සේවය කිරීම, ආදරය, දානය, පාරිශුද්ධිය, භාවනා කිරීම සහ අවබෝධ කර ගැනීම පුරුදු පුහුණු කිරීමෙන්

අධ්‍යාත්මික දැනීම පතුරුවා හැරීම

(අ) ආගමික පාඨශාලා, තේවාසිකාගාර, නවාතැන් සපයන නිවාස, අනාථ නිවාස සහ මඩම් පිහිටුවීම, නඩත්තු කිරීම හෝ ඒවාට ආධාර කිරීම ;

(ආ) කුලය, ලබ්ධිය, ජාතිය හෝ ආගම ගැන නොතකා විශ්ව සහෝදරත්වය නංවාලීම ;

(ඇ) මහත්මාවරුන්ට, භක්දවරුන්ට, රෝගීන්ට සහ දුගීන්ට ආත්මාර්ථයෙන් තොරව සේවය කිරීම ;

(ඉ) වෘද්ධයන්, අසරණයන් සහ අනාථයන් සඳහා නිවාස පිහිටුවා පවත්වාගෙන යාම ; සහ

(ඊ) මනුෂ්‍ය වර්ගයාගේ අධ්‍යාත්මික දියුණුවට අවශ්‍ය සහ හිතකර යයි සලකනු ලබන සියලු කටයුතු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ විධිවිධානවලට හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදාන යන් සහ පරිත්‍යාගයන් ලබා ගැනීමේ හෝ එකතු කර ගැනීමේ ද සිය අරමුදල් ආයෝජනය කිරීමේ ද සේවක මණ්ඩලය සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් කිසිවක් හෝ වැඩි දියුණු කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය කවර ආකාරයේ හෝ සියලු ක්‍රියා කිරීමේ ද සියලු කරුණු ඉටු කිරීමේ සහ සියලු දේ ක්‍රියාත්මක කිරීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

5. (1) සංස්ථාවේ තත් කාලයේ වලංගුව බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන — විධායක කමිටුව.

(අ) සභාපතිවරයාගෙන්, උප සභාපතිවරුන් පස් දෙනකුගෙන්, ගරු ලේකම්වරයාගෙන්, ගරු උප ලේකම්වරයාගෙන්, ගරු භාණ්ඩාගාරිකවරයාගෙන් සහ ගරු උප භාණ්ඩාගාරිකවරයාගෙන් ;

(ආ) තවත් සාමාජිකයන් විසි දෙනකුගෙන්, සහ

(ඇ) නිල බලයෙන් පත් වන ගරු අනුශාසකයන්ගෙන් සමන්විත වන විධායක කමිටුවක් විසින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී සමිතියේ විධායක කමිටුවේ නිල දරන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) ඒ ප්‍රථම විධායක කමිටුව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(1) සින්නදුරෙයි කනකරත්නම් මහතා—ගරු සභාපති

(2) කමලාසනී සූරසංගරන් මහත්මිය—උප සභාපති

(3) කන්දයියා කනකරාජා මහතා—උප සභාපති

(4) රාමපිල්ලෙයි සිවමලාර් මෙනෙවිය—උප සභාපති

(5) වෛද්‍ය කේ. සිවඥානරත්නම් මහතා—උප සභාපති

(6) එලියතම්බි වයිත්‍යලිංගම් මහතා—ලේකම්

(7) ඥානසවුන්දරී ශනකලිංගම් මහත්මිය—භාණ්ඩාගාරික.

6. සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ අස්වීම හෝ නෙරපීම සඳහා ද, සාමාජිකයන් වර්ග කිරීම සහ රැස්වීම්වල දී ඡන්දය දීමට ඔවුන්ට ඇති හිමිකම, විධායක කමිටුවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ද සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා ද එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී පැමිණ සිට ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් මේ පනතට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති, සාදනු ලැබූ විට එවැනි ම රැස්වීමක දී සහ ඒ ආකාරයෙන් ම ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම, හෝ පරිච්ඡින්න කිරීම කළ හැකිය. සංස්ථාවේ රීති.

(2) සංස්ථාවේ සියලු සාමාජිකයන් තත් කාලයෙහි බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සමිතිය විසින් ගෙවිය යුතු ණය හා සමිතියට ගෙවනු ලැබිය යුතු ණය.

7. මේ පනතේ කාර්ය සඳහා, මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ සමිතියේ පවත්නා සියලු ණය හා වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර සමිතියට අය විය යුතු සියලු ණය සහ ගෙවනු ලැබිය යුතු සියලු දායක මුදල් හා සාමාජික මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

8. විධායක කමිටුවේ සාමාජිකයන් යටත් පිරිසෙයින් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නො තබනු ලැබිය යුතු අතර එකී සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට අතිරේකව විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු බූදල් බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හෝ දැරීමට නීතිය අනුව සංස්ථාවට හැකියාව තිබිය යුතු අතර එම දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව, එකී සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මෙම පනතෙහි සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මඟින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**Annual subscription of Bills and Laws of the Parliament Rs. 30 (Local), Rs. 40 (Foreign), payable to the** Superintendent, Government Publications Bureau, **P. O. Box 500,** Colombo **1, before 15th December each year in respect** of the year following. Late subscriptions will be accepted on the conditions **that** Bills and Laws issued before the date of **payment will not be supplied.**